# දහඅත් වටගුව

## ක්‍රිකට් සහ කූඩැල්ලෝ

අපේ රටේ ජාතික ක්‍රීඩාව වොලිබෝල්. ඒ වුණාත් සුද්දන්ගෙ ක්‍රිකට් අපේ බොක්කට මේ කරම් වැදුණෙ කොහාමද කියලා හිතා ගන්නවත් බැහැ. මාධ්‍ය නිසා ක්‍රිකට් ජනතාව අතරට ගියා කිව්වට ඒක ඇත්තක් නෙවෙයි. ඒ කාලෙ අපේ අය අම්බානකට ක්‍රිකට් ගහනකොට මොන මාධ්‍යයක්ද තිබුණෙ. රේඩියෝ දැනල් දෙකයි. රූපවාහිනී කියල දෙයක් තිබ්බෙම නෑ. ක්‍රිකට් ජනප්‍රිය වෙන්න



හේතුව ඒකෙ වොලිබෝල් වලට වඩා මොකක්දෝ ගතියක් තිබුණ නිසයි කියලයි මට හිතෙන්නෙ. සීමිත කාලයකින් අඩු ඉඩකඩක අඩු වියදමින් කළ හැකි වොලි බෝල් අපි වගේ අඩු ආදායම් ඇති දියුණු වන රටකට කියාපු ක්‍රීඩාවක්. ඒත් ඒක ගම් මට්ටමෙන් ඉහළට ගෙනත් දීප ව්‍යාප්තව ජනප්‍රිය කරන්න බැරිවුණේ මොකද කියන ප්‍රශ්නය චූටි මල්ලිගෙ හිතට හැමදාම එනව.එහෙම නොවුණ එක අපේ රටේ ජනතාවගෙ අවාසනාවක්.

කොහොම උනත් ක්‍රිකට් වියදම් වැඩි ක්‍රීඩාවක් වුණාත් අපේ කොල්ලො වර්ල්ඩ් කප් එක ඉස්සුවානෙ. අම්මපා ලියන්න ගියේ ඒක ගැන නෙවෙයි.

අර කොච්චර හොඳට ක්‍රිකට් ගැහුවත් අපේ උන්ගේ අර "කොලිටි" එක තියෙන ක්‍රීඩකයන් ඉන්නෙ නම් අගේ ඇඟිලි ගානට.අනිත් එවුන්ට හැමදාම මොකක් හරි ට්‍රබල් එකක්. මේ පාර සීන් එක පටන් ගන්නකොටම කුසල් ජනිත් ගෙදර යවලා. ඒක මාර අවුල් සීන් එකක්. කරුමේ කියන්නෙ අපේ එවුන්ට මේව වෙන්නෙම සුද්දන්ගෙ රටවලදිමනෙ.

මාධ්‍ය වලින් කියපු විදිහට කුසල්ට මේක වෙලා තියෙන්නෙ කූඩැල්ලෙක් කාපු එකකට ගත්ත බෙහෙතක තහනම් උත්තේජක තිබුණ නිසා කියලයි. අපේ කාලෙ නම් කූඩැල්ලෙක් කාපුවහම වැඩිම උණොත් දාන්නෙ කඩදාසියක් පුච්චපු අලු ටිකක් විතරයි. කූඩැල්ලෝ ඉන්න ඉසව් වලට අපි යන්නෙ කකුල් වල සබන් ටිකක් ගාගෙන. එතකොට නෝ ප්‍රොබ්ලම්. දැන් කාලෙ කූඩැල්ලන් කෑවම තහනම් උත්තේජක තියෙන බේත් ගන්න වෙන තැනටම වැඩේ දුර දිග ගිහිල්ලනෙ.

කුසල් ඔහොම කරගත්තම මොකද ඩිල්ෂාන්ටත් දැන් 40 ක් විතර වෙන එකේ.

## සමුගැනීමේ ආදර්ශය

ක්‍රිකට් වලම දෙවෙනි කතාව. අම්මපා අපි ඒ දවස් වල ෂේන් වොන් එක්ක මාර ඔරොප්පුවක්නෙ තිබුණෙ. මුලු ක්‍රිකට් ලොකෙන්ම අපට පේන්න බැරුව හිටිය බෝලර් තමයි ෂේන් වොන්. මිනිහත් එක්ක විකට් වලට ෆයිට් කරපු මුරල තමයි අපේ වීරයා. හැබැයි පපුවට එකඟව ඇත්තම කියනවා නම් ෂොන් වෝන් මාරම බෝලර් කෙනෙක්. එයාගෙ එක ඕවරේක දාන බෝල වරයටීස් කූමන කතාද මල්ලි. මුරලි දක්ෂයා තමයි. විකටුත් ගත්තා. අපේ මිනිහා තමයි. ඒත් අවංකව කියනවා නම් වෝන් හිටියෙ මුරලිට වඩා ඉදිරියෙන්. මට හිතෙව දිදිහට අපේ එවුන්ගෙ හිත් වල වෝන් ගැන තිබුණෙ තරහවක් නෙවෙයි. ඊර්ෂ්‍යාවක්. උගේ ටැලන්ට් එකත් එක්ක. ඒත් ඉතින් මිනිහා අපේ ක්‍රිකට් වලට දුන්න සප් එකත් එක්ක ඒක නැතිවෙලා ගියානෙ.

වොන්ට පස්සෙ ආපු බෝලර්ලාගෙන් මට නම් අල්ලලාම ගියේ මිෂෙල් ජොන්සන්. උෟ වෝනට එහා. මිනිහගෙ බවුන්සර් වලට බැට්ස්මන්ලා ඇඹරෙන හැම් දැක්කම පිස්සු හැදෙනවා. මිනිහට විකට් එනකොට් අපි හැම තිස්සෙම කිව්වෙ "මූ බෝල දාන්නෙ විකට් එකට නෙවෙයි. ඇඟටයි පපුවටයිනෙ. එහෙම දාලා බය කරලා තමයි විකට් ගන්නෙ" කියල.

ඒක ඉගින් එයාගෙ ක්‍රමේනේ. මාරයා වගේ දුවගෙන ඇවිල්ලා අර හෙන පච්චයක් තියෙන අතින් බොලේ දැම්මම ඇඟට එන බෝලෙන් බේරෙන්න බැට් එක උස්සනකොට යන කැච් වලින් අවුට් වෙන කට්ටිය දැක්කම දුකේ බෑ හලෝ. මොන දේ කළත් මේ මිනිස්සුන්ගෙ තියෙන කොලිටිය ගන්න හරිම අමාරුයි අපේ කට්ටියට. නැත්නම් බෝඩ් එක මීඩියා එක කෝච් ටීම් එකම එපා කියද්දි ක්‍රිකට් වලින් විශ්‍රාම ගනියිද? තවත් ටොන් ගාණක් ක්‍රිකට් ඇඟේ තියෙද්දි. තමන්ගෙ කාලය අවසන් වේගන යනවා කියල දැනුනම ගෞරවණීය විදියට සමුගන්න මිනිස්සුන්ට හොඳ ආත්ම ශක්තියක් තියෙන්න ඕනෙ. නැත්නම් පච වෙලා කිච වෙලා තමයි යන්න වෙන්නෙ. මේ වගේ රටක ජාතික පිල නියෝජනය කරනවා කියන්නෙ සෙල්ලම් වැඩක්ද? අන්න නියම ස්පෝට්ස්මන් කෙනෙක්ගෙ කොලිටිය. අපි මේ සුද්දන්ට කොච්චර බැන්නත් බටහිර බටහිර කිය කිය ආඩපාලි කිව්වත් ගන්නවානම් කොච්චර ඉහළ කොලිටීස් තියෙනවද මේ අය ළඟ.



මෙන්න අපේ බොක්කෙන්ම එන ගෞරවය හා ආදරය පිළිගන්න ඔබේ සේවයට හා ආදර්ශයට

මිෂෙල් ජොන්සන්. වෙල් ඩන් මයිට්.

## ගුරු ගීතය

නවකතාවක් සිනමාවට නගද්දි මුල් කෘතියට කොයි තරම් සාධාරණයක් කරනවද කියන කාරනේ මට හැමදාම කල්පනා වෙනවා. චූටි මල්ලි සිනමාවට ආදරෙයි. ඉස්කෝලෙ කට් කරලා නුවර ෆිල්ම් හෝල් ගානෙ ගිය කාලෙ ඉඳන් අද වෙනකල් ඒ පිස්සුව අයින් වුණේ නම් නැහැ. ඒ නිසා තමයි මෙහෙට එන හැම ෆිල්ම් එකක්ම වගේ බලන්න යන්නෙ.

නවකතාවක් චිත්‍රපටියකට ගන්න එක ගැන මගේ හිතට දැනිච්ච මුල්ම අත්දැකීම වුනේ මඩොල් දූව. අපි පුංචි කාලෙ මාර්ටින් වික්‍රමසිංහ මහත්තයගෙ



මඩොල් දූව පොත කියවලා ලැබුවෙ පුදුම රසයක්. අපටත් ඕනෙ වුණා උපාලි ගිණිවැල්ලෙ වගේ පාලු දූපතක් හොයාගෙන යන්න. ඒ වීර රසයත් එක්ක අපි මවා ගත්ත සුරංගනා ලෝකයක් තිබුණා.

මඩොල් දූව අපි හිතෙන් මවාගත්තෙ ඒ සුරංගනා සිහිනත් එක්ක. ඒත් මඩොල් දූව චිත්‍රපටය අපේ ඒ සිහින ලෝකය විනාශ කළා කියලා එදා මට හිතුණා. ලෙස්ටර් මහත්තයා මැව්ව මඩොල් දූව අපේ හිත්වල තිබුණ මඩොල් දූවට වඩා ගොඩක් වෙනස් එකක්. අපරාදෙ කියලා එදා චූටි මල්ලිට හිතුණා.

ඊයෙ පෙරේදා මෙහේ පෙන්නපු ගුරු ගීතය බලලත් මට හිතුණෙ ඒ ටිකම තමයි. ගුරු ගීතය කියන්නෙ අපි කවුරුත් ඉතාමත් ආසාවෙන් කියවපු පොතක්. අපි ගුරු ගීතයෙ අකුරු වලින් මවාගෙන හිටිය දුයිෂෙන් කෙනෙක් හිටියා. අල්තීනා කෙනෙක් හිටියා. දුයිෂෙන් ගුරුතුමාගෙ දුප්පත් ගම - ඉස්කෝලෙ හැම දෙයක්ම අපි මවාගෙන හිටියා. මේ ගුරු ගීතයේ ඒ කිසි දෙයක් මට දැනුණේ නැහැ. අවුල තියෙන්නෙ ගුරු ගීතය කියන්නෙ ලංකාවේ දේශපාලන ඉතිහාසයේ වැඩිම පරිත්‍යාග කරපු පරම්පරාවකගෙ අත්පොතක් බඳු පොතක් නිසා එක අතකට අදියුරුට දොස් කියලා වැඩක් නැහැ. ලෙස්ටර් වගේ වැඩ්ඩෙකුටත් වැඩේ ගැස්සුණා නම් නව යුගයේ වැඩ ගැන කවර කතාද? දැන් ලෝකයේ මිනිස්සු රසය විඳීම දිහා බලන්නෙ එක එක විදිහටනෙ. ඒ නිසා ඒ ඒ කෝණ වලින් බලලා ඕන ඕන නිර්මාණ කරන්න නිදහස තියෙනවා. නිදහස තිබුණාට මේ වගේ වැඩක් කරනකොට මෙයට වඩා සීරියස් වෙන්න තිබුණා කියලයි මට හිතෙන්නෙ. ආශාව උනන්දුව එක්ක ප්‍රතිභාව හා දැක්මකුත් තියෙන්නෙ ඕනෙ ලොක්ක නිර්මාණ කරනකොට.

තරහට කේන්තියට නෙවෙයි මේ ලියන්නෙ දුකද දරාගන්න බැරුව. ඇස් වලින් සට සට ගාලා කඳුළු වැටෙනවා ලොක්කා

## තිස්ස

තිස්ස අබේසේකර කියන්නෙ අපේ ලංකාවෙ හිටිය මහා බුද්ධිමතෙක්. මහා සිනමාවේදියෙක්. ඔහුගෙ පුද්ගලික ගති පැවතුම් ගැන අපි දන්නෙ නැහැ. නමුත් කලාවෙදි නිර්මාණයෙදි එයා කප් ගහපු කෙනෙක්. එහෙව් කලාකාරයෙක් එක්ක චිත්‍රපටයක් නිෂ්පාදනය කළ මහත්මියකට ඉතා අමිහිරි අත්දැකීම් වැලකට මුහුණ දෙන්න වුණා කියලා ඇය කියලා තිබුණා. ඇය ඒ අත්දැකීම් පොතක ලිව්වා. මුද්‍රණයට දුන්නා. ඒ අතරේ තිස්ස මිය යනවා. ඇය බුද්ධිමත් ලෙස හා මානුෂික ලෙස වහාම සිය පොත මුද්‍රණය කිරීම නවත්වනවා.

"ඔහු දැන් මිය ගිහින්. ඔහුට මගේ ප්‍රශ්න වලට උත්තර දෙන්න විදිහක් නැහැ. ඒ නිසා මම මි පොත මුද්‍රණය කරලා ප්‍රසිද්ධ කරන එක වැරදියි" ඇය කියනවා. ඇගේ ඒ පියවර ඉතාම ශ්‍රේෂ්ට එකක්. බුද්ධිමත් එකක්. අපි ඇයට ඒ ගැන හිස නමා ආචාර කරනවා.

ඒත් ඇය කළ ඒ ක්‍රියාවේ ශ්‍රේෂ්ට බව පත්තරකාරයෙන් විනාශ කරලා තියෙන හැටි දැක්කම හිතට ඇතිවුණෙ මහා කළකිරීමක්. අර කාන්තාව මුද්‍රණය නොකළ පොතේ තිබුණ චෝදනා අවලාද සියල්ලම මහා වීර කමක් වගේ පත්තර පිටුවක දිගඅරින මේ පත්තර මිත්‍රයා කළේ කොයි



තරම් පහත් වැඩක්ද? ඒ චෝදනා වලට උත්තර දෙන්න තිස්සට මිනී වලෙන් නැගිටලා එන්න පුලුවන්ද? හැම කතාවකටම දෙපැත්තක් තියෙනවා. ඒ දෙපැත්තටම උත්තර දෙන්න බැරි වේදිකාවක ඒ ප්‍රශ්න දිග අරින මිනිහා කරන්නෙ ඉතාම සදාචාර විරෝධී වැඩක්. සදාචාරය ගැන ලොරි ගණන් ලොකු ටෝක් දෙන අය අතින් මේ වගේ දේ වෙනකොට අපට කියන්න වචන නෑ දොරේ.

**චූටි මල්ලි**

Dias Maths
M. Sc Mathematics (USA)
M. Sc Computer Science
B. Sc Mathematics
Mathematics
Grades 6 / 7 / 8 / 9 / 10
VCE – General Maths /
Maths Methods / Specialist Maths
0431 182 632
keerthicnc@yahoo.com
Home visiting
www.facebook.com/DiasMaths